**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2022.02.25 |
|---|---|---|

**පැමිණිලි පාර්ශවය** : ඩී.ආර්.අයි.ඒ.බී.දෙහිගම මහතා,
අංක : 193/3 බී, හීරැස්සගල පාර,
මහනුවර.

වගඋත්තර පාර්ශවය : 01. කේ.ඩබ්.ඩී.යූ.චන්ද්‍රකුමාර මහතා,
විදුහල්පති,
කිංස්වුඩ් විද්‍යාලය,
මහනුවර.

02. එන්.අලහකෝන් මහතා,
අධ්‍යාපන අධ්‍යක්ෂ,
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
මහනුවර.

<u>පැමිණිලි අංකය</u> : **<u>HRC/K/67/21-W</u>**

පැමිණිල්ල :-

ඉහත නම සඳහන් පැමිණිලිකාර පාර්ශවය 2021.02.12 වන දින මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් යොමු කරමින් සඳහන් කර ඇත්තේ, අයදුම්පත් අංක : BR36 යටතේ සහෝදර පදනම මත 2021 වර්ෂයේ පළමු ශ්‍රේණිය සඳහා වගඋත්තරකාර මහනුවර කිංස්වුඩ් විද්‍යාලය වෙත තම දරුවා වන දෙහිගම රාළලාගේ නිතින සිහස් බණ්ඩාර දෙහිගම යන අය පාසලට ඇතුළත් කර ගැනීම සඳහා අයදුම්පත් යොමු කිරීමෙන් පසු පැවති සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 66.4 ප්‍රමාණයක් හිමි කර ගත් බවත්ය. අවම කඩඉම් ලකුණ 38 ලෙස සලකා බැලූවෙන් තම දරුවා අදාළ පාසලට ඇතුළත් වීම සඳහා සුදුසුකම් සපුරා තිබුණු නමුත් පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛනය නොමැති බව පවසමින් අවසන් මොහොත දක්වාම තම දරුවා පාසලට ඇතුළත් කර නොගැනීම සම්බන්ධව තමාට කිසිදු දැනුම් දීමක් සිදු නොකිරීමෙන් හා තම දරුවා අදාළ පාසැලට ඇතුළත් කර නොගැනීමෙන් තමන් බලවත් අපහසුතාවකට පත් කළ බවත්ය.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrc@gmail.com
දුරකථන / தொலைபேசி: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர்: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு: 1996
වෙබ් / இணையம்: www.hrcsl.lk

තවද, කොවිඩ් -19 වසංගත තත්වය හේතුවෙන් රාජ්‍ය ආයතන වෙත යාමට හා සේවාවන් ලබා ගැනීමට තිබූ අපහසුතා හේතුවෙන් තම බදු ඔප්පුව දීර්ඝ කර ගත නොහැකි වූ බව දැනුම් දීමෙන් අනතුරුව 2021.01.16 අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයෙන් ද තම දරුවාගේ නම ප්‍රදර්ශනය කිරීමට නිර්දේශ කර තිබියදීත් තම දරුවාට මෙම විද්‍යාලයට ඇතුළත්වීමට තිබූ අවස්ථාව අහිමිකර ඇති බවත්, එය තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් වන බවත්, ඒ සඳහා සාධාරණය ඉටුකර දෙන ලෙසත් මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටියි.

**වගඋත්තර පාර්ශ්වීය කරුණු දැක්වීම :-**

වගඋත්තර පාර්ශ්වීය මහනුවර, කිංස්වුඩ් විද්‍යාලයීය විදුහල්පතිගේ අංක : මහ/කිංස්වුඩ්/04/01/2021 හා 2021.02.25 දිනැති ලිපිය කොමිෂම වෙත යොමු කරමින්, 2021 වසරේ පළමු ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම සඳහා දෙහිගම රාළලාගේ නිතින සිහස් බණ්ඩාර දරුවාගේ අයදුම්පත තම විද්‍යාලයට යොමු කර ඇති බවත්, එය 2021/BR/36 යටතේ ලේඛන ගත කර ඇති බවත් සඳහන් කර සිටි.

එසේම, පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීමේ 29/2019 චක්‍රලේඛනය යටතේ 7.2.1.1 උප ලේඛනයේ සඳහන් ආකාරයට පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛනය වන මෙහි සඳහන් බදු ඔප්පුව අවම වශයෙන් අයදුම්පත භාරගන්නා අවසන් දින සිට ඉදිරි වර්ෂයක කාලයක් සඳහා වලංගු විය යුතු නමුත්, මෙම පැමිණිලිකාර පාර්ශවය විසින් අමුණා ඇති අංක 159 දරණ බදු ඔප්පුව වසර 4 ක කාලයක් සඳහා සකස් කර ඇති බැවින් හා බදු ඔප්පුවේ වලංගු කාලය 2021.01.01 දිනෙන් අවසන් වී ඇති බැවින්, ලකුණු දීම ප්‍රතික්ෂේප කළ බව තවදුරටත් කරුණු ගෙනහැර දක්වමින් සඳහන් කරයි.

කොවිඩ් වසංගත තත්වය නිසා බදු ඔප්පු දීර්ඝ කර ගැනීමේ ක්‍රියාවලියට බාධා වූ බව පිළිගත නොහැකි බවත් තවද, මේ පිළිබඳව පාසලේ දුරකතනය හරහා ඇමතුම් ලබා දී පැමිණිලි පාර්ශවය දැනුවත් කළ බව ද වගඋත්තර පාර්ශවය වැඩිදුරටත් දන්වා සිටි.

**පරීක්ෂණයේ දී අනාවරණය වී ඇති කරුණු :-**

දෙපාර්ශවයේ ලිඛිත සැල කිරීම් සිදුකිරීමෙන් පසු පැමිණිලිකරුගේ දරුවා වන දෙහිගම රාළලාගේ නිතින සිහස් බණ්ඩාර දෙහිගම, 2021 වර්ෂයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම සඳහා මහනුවර කිංස්වුඩ් විද්‍යාලයට අයදුම්පත් යොමුකර ලකුණු 66.4 ක ලකුණු ප්‍රමාණයක් ලබාගෙන ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව පැමිණිලිකරුගේ පදිංචිය තහවුරු කරන අංක 2017 ජනවාරි 02 දින සිට 2021 ජනවාරි මස 1 වන දින දක්වා වසර 04 කට ලියාපදිංචි වූ 159 දරණ බදු ඔප්පුවත්, 2021 ජනවාරි මස 2 වන දින සිට 2023 ජනවාරි මස 1 වන දින දක්වා වසර 02 කට ලියාපදිංචි වූ අංක 534 දරණ බදු ඔප්පුවත් 2020 දෙසැම්බර් මස 24 දින ලියාපදිංචි අංක 2628 යටතේ පේරාදෙණිය තැපැල් කාර්යාලයෙන් තැපැලට යොමු කළ බවත් පැමිණිලිකාර පාර්ශවය කරුණු ඉදිරිපත් කරන ලද අතර, කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් හා සිදු වූ ප්‍රමාදයන් පදනම් කරගෙන මෙම දෙවන බදු ඔප්පුව දීර්ඝ කර ගැනීම ප්‍රමාද වූ බවට පැමිණිලිකරු විසින් ඉදිරිපත් කළ කරුණු

යළ ලංකා බලා අභියාචනා මණ්ඩලයේ සභාපති විසින් ද "කොවිඩ් - 19 තත්වය යටතේ බඳු ඔප්පු දීර්ඝ කර ගැනීමට නොහැකි වීම සම්බන්ධව දිවුරුම් ප්‍රකාශයකින් කරුණු ඉදිරිපත් කර ඇති නිසා ප්‍රකාශන ඔප්පුව මඟින් දීර්ඝ කිරීම සනාථ වන බැවින්" සහෝදර පදනම යටතේ නම ප්‍රදර්ශනය කිරීමට නිර්දේශ කර ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව 2021.07.22 වන දින මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මහනුවර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය කොවිඩ් - 19 වසංගත කාල සීමාවේ දී වසා තැබීම හේතුවෙන් කාර්යාල කටයුතු වල ප්‍රමාදයක් සිදුවූවා ද යන්න ලිඛිතව විමසා බැලීමක් සිදුකර ඇති අතර, එයට පිළිතුරු වශයෙන් මහනුවර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය විසින් කොමිෂම වෙත යොමු කරන ලද ලිපියෙන් 2021.03.08 වන දින සිට 2021.04.20 දින දක්වා එම කාර්යාලය වසා තිබූ බවත්, ඉන්පසු දිගටම රාජකාරි කටයුතු කරගෙන ගිය බවත් දන්වා ඇත.

ඒ අනුව අදාළ දෙහිගම රාළලාගේ නිතින සිහස් බණ්ඩාර දෙහිගම යන අය පහත පරිදි ලකුණු ලබාගෙන ඇත.

| නිර්ණායක | අයදුම්කරු විසින් සටහන් කරන ලකුණු | ප්‍රථම සම්මුඛ පරීක්ෂණ ලකුණු | අභියාචනා හා විරෝධතා පරීක්ෂණයේ ලකුණු | සටහන් |
|---|---|---|---|---|
| දැනට පාසලේ ඉගෙනුම ලබන සහෝදරයින් | 8 | 8 | | |
| කාර්යාලයෙන් ඇතුළත්ව ඉගෙනුම ලැබීම | 5 | 5 | | |
| සහෝදරයින් දෙදෙනෙකුට වඩා ඉගෙනුම ලැබීම | - | - | | |
| සහෝදරයින් පාසලට ලබා දී ඇති ජයග්‍රහණ | 10 | 07 | | |
| පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛන | 04 | 2.4 | | |
| ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචිය | 20 | 20 | | |
| පාසලට ඇති ආසන්නතාවය | 30 | 24 | | |
| එකතුව | 77 | 66.4 | | |

,ණයය :-

පැමිණිලිකරුගේ දරුවා වන දෙහිගම රාළලාගේ නිතින සිහස් බණ්ඩාර දෙහිගම යන අය 2021 වර්ෂයේ වගඋත්තරකාර විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත්කර ගැනීම සඳහා පැවති ප්‍රථම සම්මුඛ පරීක්ෂණයේ දී පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛනයට අදාළව අවම ලකුණු ප්‍රමාණයක් ලෙස ලකුණු 2.4 ක් සහිතව ලකුණු 66.4 ක ප්‍රමාණයක් ලබා ගෙන ඇත.

මෙම ලකුණු, පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීමේ 29/2019 චක්‍රලේඛනයේ 7.2.1.1 උපලේඛනයට අනුකූලව ලබා දී ඇත. ඒ අනුව මෙම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කළ යුතු බවට කිසිදු නීතිමය ප්‍රතිපාදනයක් එහි සඳහන්ව නොමැත.

තවද, පදිංචිය තහවුරු කරනු ලබන ලේඛනය සැලකීමේදී එය අවුරුදු 4 ක් දක්වා එනම්, 2017 ජනවාරි 02 දින සිට 2021 ජනවාරි 01 දින දක්වා වලංගුව පවතින බවත්, අයදුම්පත භාරගන්නා දින සිට වසරකට වැඩි කාලයක් ලෙස දක්වා සිටියද මෙම බදු ඔප්පුව සැලකීමේදී එය අයදුම්පත් භාරගන්නා දින සිට මාස 06 ක කාලසීමාවකට වඩා වැඩි කාලයක් සඳහා වලංගුව පවතින බව නිරීක්ෂණය වන අතර, සාමාන්‍ය ක්‍රමවේදය වනුයේ බදු කාලය අවසන් වීමෙන් පසු එම බදු කාලය නැවත දීර්ඝ කිරීමයි.

පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛනය වන අංක 534 දරණ දෙවන බදු ඔප්පුව, 2020 දෙසැම්බර් මස 24 දින ලියාපදිංචි අංක 2628 යටතේ පේරාදෙණිය තැපැල් කාර්යාලයෙන් තැපෑලට යොමු කරන ලද බවත්, කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් කාර්යාල වල සිදු වූ ප්‍රමාදයන් පදනම් කරගෙන එම දෙවන ඔප්පුව දීර්ඝ කර ගැනීම ප්‍රමාද වූ බවට පැමිණිලිකරු විසින් දක්වා සිටින කරුණු සාධාරණ බවට පිළිගෙන 2021.01.16 වන දින පැවති අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයෙන් ද මෙම දරුවාගේ නම ප්‍රදර්ශනය කිරීමට නිර්දේශ කර ඇතත්, වගඋත්තරකාර පාර්ශවය ඒ අනුව කටයුතු කර නොමැත.

පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීමේ 29/2019 චක්‍රලේඛනයේ 12 : 08 හි සඳහන් ආකාරයට අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය විසින් දෙනු ලබන තීරණය අවසාන තීරණය වන බැවින්, ඉන් පසුව ගනු ලබන තීරණයන් වලංගු නොවන බව දක්වා ඇත.

ඒ අනුව සහෝදර පදනම යටතේ ළමුන් තෝරාගැනීමේ කඩඉම් ලකුණු ප්‍රමාණය 38 ක් වන අතර මෙම ලකුණු පරාසය සලකා බැලීමේ දී ලකුණු 66.4 ක් ලබා ගත් මෙම පැමිණිලි පාර්ශවීය දරුවා වන දෙහිගම රාළලාගේ නිතින සිහස් බණ්ඩාර දෙහිගම යන අය මහනුවර කිංග්ස්වුඩ් විද්‍යාලයට ඇතුළත් කර නොගැනීමෙන් පැමිණිලි පාර්ශවයට දැඩි අගතියක් සිදු කර ඇති බව කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇත.

ඒ හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට ඇති "නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය" යන මූලික අයිතිවාසිකම උල්ලංඝණය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය:-

පැමිණිලිකරුගේ දරුවා වන දෙහිගම රාළලාගේ නිතින සිහස් බණ්ඩාර දෙහිගම යන අය 2021 වර්ෂයේ වගඋත්තරකාර විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් වීමට නියමිතව තිබූ අතර, ඒ අනුව 2022 වර්ෂයේ දෙවන ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමට පියවර ගත යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022.03.25 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලි පාර්ශවය විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

රෝහිණී මාරසිංහ,
(හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු),
සභාපතිනි,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner

ම.ගේ.නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත : ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

ස/-